**වනජීවී සංරක්ෂණ අරමුදල - 2016**

-----------------------------------------------

වනජීවී සංරක්ෂණ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2009 අංක 22 දරන වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත මඟින් සංශෝධිත වනසත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 71(2)(ඌ) යටතේ නිකුත් කරනු ලබන නියෝග සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 වගන්තිය ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්ත්වයට ගෙන ආ දින සිට ක්ෂය කිරීම ආරම්භ කල යුතුය. එහෙත් ඊට පටහැනි ලෙස අරමුදලේ වත්කම් ක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකස්කර තිබුණි. ඒ අනුව ආයතනය විසින් මුළු වර්ෂය සඳහාම වත්කම් ක්ෂය කිරීම හේතුවෙන් එකතුව රු.6,549,506 ක් වැඩියෙන් ක්ෂය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතු රු.4,716,463 ක් ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුව වෙත සෘජුව ලැබී තිබූ එකතුව රු.24,455,199 ක ආදායම් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | මිලදී ගනු ලබන වත්කම් ඉන්වොයිසියේ සඳහන් වටිනාකමට වත්කම් ලේඛනයේ ඇතුළත් කර තිබුණද වාර්ෂික ක්ෂයවීම්, අගය වැඩිවීම් හෝ අපහරණය කිරීම් වෙන් වෙන්ව ඇතුළත් කර නොතිබුණි. |

(ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය

එකතුව රු.5,840,653 ක පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

---------------------------------

(i) 5.2.4 වගන්තිය

මුදල් වර්ෂය අවසාන වීමට මාස 3 කට පෙර ඊළඟ වර්ෂයේ අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවද, 2016 වර්ෂයේ අයවැය ලේඛනය 2016 මාර්තු 04 දින අනුමත කර ඉදිරිපත් කර තිබුණි.

(ii) 8.2.2 වගන්තිය

සමාලෝචිත වර්ෂයේදී රු.630,839,778 ක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණද, ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා අදාල අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) 2013 අගොස්තු 07 දිනැති අංක 4/2013 දරන අභ්‍යන්තර ගිණුම් චක්‍රලේඛය

එකතුව රු.2,018,765 ක පරිත්‍යාග භාර ගැනීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ අතිරික්තය රු. 1,168,164,618 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.942,005,927 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.226,158,691 ක වර්ධනයක් දක්නට ලැබුණි. මුළු වියදම රු.250,160,200 කින් වැඩිවී තිබුණද උද්‍යාන පිවිසුම් ගාස්තු රු.381,680,278 කින් වැඩිවීම හා සේවා ගාස්තු රු.63,406,700 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**4.1 කාර්යසාධනය**

-----------------

1968 නොවැම්බර් 29 දිනැති අංක 14/830 දරන ගැසට් පත්‍රය අනුව අරමුදලේ පරමාර්ථ පහත දැක්වේ.

(i) වනසතුන් ආරක්ෂා කිරීම හා සුරක්ෂණය කිරීම කෙරෙහි මහජන උද්යෝගය දියුණු කිරීම.

(ii) වනසතුන් ආරක්ෂා කිරීමේ හා සුරක්ෂණය කිරීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබූ සියලු ප්‍රදේශ පවත්වාගෙනයාම, දියුණු කිරීම හා වර්ධනය කිරීම.

(iii) ස්වකීය බලතල පාවිච්චි කිරීමේදී හෝ විශිෂ්ට දක්ෂතාවය හෝ නිර්භීතභාවය පිළිබිඹු කොට ඇති නිලධරයන්ට සහ මහජනයාට පාරිතෝෂිත හෝ ප්‍රදාන පිරිනැමීම.

(iv) වනසතුන් හා වෘක්ෂලතා අඥාපනතේ 11 වන උපලේඛනයෙහි නියමිත යම් යම් ලිඛිත නීතියක් යටතේ සිදුකරනු ලැබූ වැරදි සඳහා තැනැත්තන් වැරදිකරුවන් කිරීම සඳහා නියම ලෙස හෝ අනියම් ලෙස දැනුම් දෙන්නන් වශයෙන් හෝ අන් ලෙසකින් වගකිව යුතු තත්ත්වයට පැමිණ සිටින තැනැත්තන් හට පාරිතෝෂික හෝ ප්‍රදාන පිරිනැමීම සහ පූර්වෝක්ත පරමාර්ථ අතුරෙන් කිසිවකට සම්බන්ධ වූ සියලු කරුණු දියුණු කිරීම හා වර්ධනය කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සකස්කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ රු.366,350,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ව්‍යාපෘති 38 ක් 2017 ජූනි 30 දින දක්වාම ආරම්භ කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවූ ව්‍යාපෘති 56 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.109,510,950 ක් වැය කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.51,510,000 ක මුදලක් නිදහස් කර තිබුණු ව්‍යාපෘති 14 ක සියයට 50 කට වඩා අඩු මූල්‍ය හා භෞතික ප්‍රගතියක් ලබා තිබුණි.

(ඈ) දකුණු වනජීවී කලාපයට අයත් උඩවලව ඇත් අතුරු සෙවනේ නිරීක්ෂණ මැදිරි 4 ක් ඉදි කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.8,000,000 ක් වෙන් කර තිබුණද සත්‍ය වශයෙන් රු.8,208,600 ක වියදමක් දරා නිරීක්ෂණ මැදිරි 02 ක් පමණක් ඉදි කර තිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී මන්නාරම කාර්ය මණ්ඩල නිවාසය, අඩවි ආරක්ෂක කාර්යාලය හා කම්කරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ රු.1,933,200 ක අත්තිකාරමක් ලබාදී තිබුණු අතර විගණන දිනය වූ 2017 මාර්තු 08 දින දක්වාම ඉදි කිරීම් ආරම්භ කර නොතිබුණි. අත්තිකාරම් ඇපකරය කල් ඉකුත්වීමට පෙර, ගෙවන ලද අත්තිකාරම් මුදල අයකර නොගැනීම සම්බන්ධයෙන් වූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ඇත් අතුරු සෙවන නැරඹීමට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ගෙන් ගාස්තු අයකර ගැනීම සඳහා අතින් ලියන ලද පොදු 172 කුවිතාන්සිය භාවිතා කර තිබුණු අතර යාන්ත්‍රික ක්‍රමවේදයකට ලදුපත් නිකුත් කිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) මිනිස් ජීවිත හානි අවම කිරීමේ අරමුණින් සමාලෝචිත වර්ෂය තුළදී අලිවෙඩි මිලදී ගැනීම වෙනුවෙන් රු.86,635,431 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂයේදී සතුන් නිසා මිනිස් ජීවිත හානි 88 ක් සිදු වී තිබුණි.

(ඇ) **උඩවලව අලි රැඳවුම් මධ්‍යස්ථානය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිරීක්ෂණ මැදිරි 03 ක් ඉදිකිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ 2016 අප්‍රේල් 05 දින රු.10,247,956 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව දින 90 කින් නිම කළ යුතු විය. එහෙත් විගණිත දිනය වූ 2017 මාර්තු 08 දිනවන විටත් ඉදිකිරීම් නිම කර භාරදී නොතිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 6.4 වගන්තිය ප්‍රකාරව ආරම්භක කොන්ත්‍රාත් මුදලින් දිනකට සියයට 0.05 බැගින් වූ ප්‍රමාද දඩ මුදලක් අය කළ යුතු වුවත් 2017 ජූනි 30 දින තෙක් එසේ අය කර ගෙන නොතිබුණි.

(ii) අලි රැඳවුම් මධස්ථානය ඉදිරිපිට මාර්ගය පස් යොදා තැලීම වෙනුවෙන් රු.678,425 ක් ගෙවා තිබුණ ද 2017 මාර්තු 19 දින වන විටත් අදාළ ඉදිකිරීම් සිදුකර නොතිබුණි.

(iii) උඩවලව අලි රැඳවුම් පරිශ්‍රයේ වැට ශක්තිමත් කිරීම සඳහා 2'GI බට 02 ක් තිබෙන ස්ථානවල 2' GI බට 03 ක් යෙදීමට තීරණය කර තිබුණ ද අංක 13 හා 19 රැඳවුම් මධ්‍යස්ථානවල එසේ GI බට සවි කර නොතිබියදී ඒ සඳහා රු.309,556 ක් ගෙවීම් කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

2012 වර්ෂයේදී රු.11,730,808 ක් වැය කර ඉදිකර තිබුණු විල්පත්තුව ජාතික උද්‍යානයේ පිහිටි කොල්ලන්කනත්ත (වීවල) සංචාරක බංගලාව ජල ගැටළු පැවතීම හේතුවෙන් භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

**4.4 වාහන උපයෝජනය**

වනජීවී දෙපාර්තමේන්තුවට අයත් වාහන 86 කට අදාළව රක්ෂණාවරණ ලබාගැනීම සඳහා රු.5,846,203 ක් අරමුදලින් ගෙවා තිබුණි.

**5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම අරමුදලක් විසින්ම මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද අරමුදලේ 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව 2014 - 2018 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

--------------------------

ආයතනයේ පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේද දුර්වල තත්ත්වයක පවතින බව අරමුදලේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිරීක්ෂණය කර තිබුණද ඒවා සවිබල ගැන්වීමට ප්‍රවේශයක් ආයතනය තුළ නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර අරමුදලේ කාර්යභාරය පුළුල්වීමට සාපේක්ෂව අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය වැඩිකිරීමට කටයුතු කර නොතිබුණි. තවද වාර්ෂික විගණන වැඩසටහනෙහි ඇතුළත් කාර්යභාරයන් තුළ අරමුදලේ කාර්යසාධන විගණනයට ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

---------------------------------

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර අවස්ථා 11 ක දී සියයට 18 සිට සියයට 208 දක්වා පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

## 5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 මැයි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි අරමුදලේ විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් පාලනය | (i) | දඩ මුදල් ලැබීම් නිසි පරිදි අදාළ වර්ෂයන් අනුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | පරිගණක ලේඛන, උප පත්‍රිකා පොත් ලේඛන සහ විස්තරාත්මක උප ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය. | | ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුතු සිදු කර නොතිබීම. |
| (ඇ) | තොග පාලනය. | | ප්‍රාදේශීය කාර්යාලවල තොග ලේඛන නිසි පරිදි පවත්වා ගෙන ගොස් නොතිබීම. |
| (ඉ) | ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම | | පරිගණකගත ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට අවධානය යොමු කර නොතිබීම නිසා මුදල් අයථා පරිහරණයට ඉඩ ප්‍රස්ථා පවතින බවත් මුදල්වල නිවැරදිතාවය පිළිබඳ ගැටළුකාරී බවත් විගණනයේදී නිරීක්ෂණය විය. |

| | | | |
|---|---|---|---|
| (උ) | වාහන පාලනය | (i) | වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති වාහන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| | | (ii) | අරමුදල සතු වාහන වෙනුවෙන් ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| | | (iii) | සියලුම වාහනවලට අදාළ මාසික සාරාංශවල මුල් පිටපත් සමග දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම. |
| | | (iv) | වාහනවල රාජ්‍ය ලාංඡනය හා ආයතනයේ නම පින්තාරු කිරීමට කටයුතු නොකිරීම. |